# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 සැප්තැම්බර් මස 08 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017.09.11 දින නිකුත් කරන ලදී)


# මහ නගර සභා (සංශෝධන)

(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි, එම නව වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහ නගර සභාවල සංයුතිය සංශෝධනය කිරීම වේ.

එල්.ඩී.—ඕ. 49/2017.

## (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක දරන මහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

252 වන අධිකාරයේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මහ නගර සභාවල සංයුතිය.

5. (1) එක් එක් මහ නගර සභාවක් -

(අ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඇ සහ 3ඈ වගන්ති යටතේ කරනු ලබන නියම මත පදනම් වී, අමාත්‍යවරයා විසින් *ගැසට්* පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්;

(ආ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ වගන්තිය යටතේ තෝරා යැවිය යුතු සභිකයන් වන, (අ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවෙන් සියයට හතළිහක ට සමාන සභිකයන් සංඛ්‍යාවකින්; සහ

(ඇ) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65ආ

වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභිකයන් සංඛ්‍යාවකින්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සියයට හතළිහක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම උපවගන්තියේ කාර්යය සඳහා එකී සියයට හතළිහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස, පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.''.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.